# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.15 පැය 0600 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 738 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාතර්ා වූ වැදගත් තොරතුරු**

**01. මනුෂ්‍ය ඝාතනයක් - ගලහ පොලිස් වසම.**

2025.03.14 වන දින සවස් කාලයේ ගලහ පොලිස් වසමේ කොටගේපිටිය ප්‍රදේශයේදී තියුණු ආයුධයකින් පහරදීමක් හේතුවෙන් බරපතල තුවාල ලැබූ පුද්ගලයෙකු පල්ලේගම රෝහලට ඇතුළත් කිරීමෙන් පසු මියගොස් ඇති බවට ගලහ පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමශර්න ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 26 ක් වූ නවනැලිය, කොලබිස්ස ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු තවත් පුද්ගලයෙකු සමඟ පැවති පැරණි ආරවුලක් හේතුවෙන් මෙම ඝාතනය සිදුකර ඇති බවට දැනට සිදුකල විමශර්නයේදී අනාවරණය වී ඇත. මෙම ඝාතනයට සම්බන්ධ **වයස අවුරුදු 36 ක් වන කොලබිස්ස ප්‍රදේශයේ පදිංචි සැකකරු අත්අඩංගුවට ගෙන ඇත.**

මෘත ශරීරය පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා පේරාදෙනිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. ගලහ පොලිසිය වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි

**02. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - හෝමාගම පොලිස් ස්ථානය.**

2025.04.14 වන දින සවස් කාලයේ හෝමාගම පොලිස් වසමේදී හෝමාගම පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **හෙරොයින් ග්‍රෑම් 07 මිලිග්‍රෑම් 263 ක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 32 ක් වන මොරගහලගොඩ, කටුවන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

හෝමාගම පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**03. මෙරට නිෂ්පාදිත ගිනි අවි සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පුවරසන්කුලම පොලිස් ස්ථානය.**

2025.04.14 වන දින සවස් කාලයේ පුවරසන්කුලම පොලිස් වසමේ ශිවනගර් ප්‍රදේශයේදී පුවරසන්කුලම පොලිස් ස්ථනයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 66 ක් වන ශිවනගර් ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පුවරසන්කුලම පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**04. මාරක රිය අනතුරක් - මිහින්තලය පොලිස් වසම.**

2025.04.14 වන දින රාත්‍රී කාලයේ මිහින්තලය පොලිස් වසමේ ඒ 09 මාගර්යේ වැල්ලමොරාණ ප්‍රදේශයේදී ගල්කුලම දෙස සිට මිහින්තලය දෙසට ධාවනය වූ කැබ් රථයක් රියදුරුට පාලනය කරගත නොහැකිව මාගර්යෙන් ඉවතට පැන බෝක්කුවක ගැටී අනතුරක් සිදුව ඇත.

අනතුරින් තුවාල ලැබූ කැබ් රථයේ රියදුරු හා තවත් පුද්ගලයෙකු ප්‍රතිකාර සඳහා මිහින්තලය රෝහලට ඇතුලත් කිරීමෙන් පසු රියදුරු මියගොස් ඇති අතර අනෙක් පුද්ගලයා අනුරාධපුර රෝහල වෙත මරුකර යවා ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇත.

**මරණකරුවන් අවුරුදු 25 සහ 37 වයස්වල පසුවන අනුරාධපුර සහ පළුගස්වැව ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

අනතුර සම්බන්ධයෙන් මිහින්තලය පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**05. මාරක රිය අනතුරක් - මහවෙල පොලිස් වසම.**

2025.04.14 වන දින දහවල් කාලයේ මහවෙල පොලිස් වසමේ අංකන්ද කවුඩුපැලැල්ල මාගර්යේ අංකන්ද ප්‍රදේශයේදී හතමුණගාල දෙස සිට අංකන්ද දෙසට කඳු සහිත මාගර්යේ ධාවනය වූ ත්‍රීරෝද රථයක් රියදුරුට පාලනය කරගත නොහැකිව පසුපසට ධාවනය වී පෙරළීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ ත්‍රීරෝද රථයේ ගමන් කළ කාන්තාවක් , පිරිමි පුද්ගලයෙකු හා රියදුරු තුවාල ලබා මාතලේ රෝහලට ඇතුලත් කිරීමෙන් පසු පසුපස අසුනේ ගමන් කළ පුද්ගලයා මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 71 ක් වූ මඩවල උල්පත ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය මාතලේ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. මහවෙල පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**06. මාරක රිය අනතුරක් - උප්පුවේලි පොලිස් වසම.**

2025.04.14 වන දින රාත්‍රී කාලයේ උප්පුවේලි පොලිස් වසමේ ත්‍රිකුණාමලය පුත්තලම මාගර්යේ වල්ගම්වෙහෙර ප්‍රදේශයේදී ත්‍රිකුණාමලය දෙස සිට වව්නියාව දෙසට ධාවනය වූ යතුරු පැදියක් මාගර්ය හරහා ගමන් කළ වන අලියෙකුගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ යතුරු පැදිකරු හා පසුපැදිකරු ත්‍රිකුණාමලය රෝහලට ඇතුලත් කිරීමෙන් පසු පැදිකරු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 31 ක් වූ වව්නියාව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය ත්‍රිකුණාමලය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. උප්පුවේලි පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**